# ශ්‍රී ලංකා නීති විද්‍යාල ප්‍රවේශ විභාගය

## 2024 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම

ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ 2024 අධ්‍යයන වර්ෂයට සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා වන තරග විභාගය වෙනුවෙන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් මාර්ගගත ( Online ) ක්‍රමය ඔස්සේ අයදුම්පත් කැඳවනු ලැබේ.

විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කල යුතුය. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියෙන් විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ඇතුළත්වීමේ සුදුසුකම්**

01. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුයි.

02. ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන අවස්ථාවේදී වයස අවුරුදු 17 සම්පූර්ණ විය යුතුයි. (ඒ අනුව 2006-08-16 දින හෝ දිනට පෙර උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කළ හැක.)

03. (අ). ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ශ්‍රී ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී හෝ

(ආ). එක්සත් රාජධානියේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස්පෙළ) විභාගයේදී හෝ

(ඇ). ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කරනු ලබන ඉහත (අ) සහ (ආ) අනුඡේදවල සඳහන් උසස් පෙළ මට්ටමේ සුදුසුකමක් ලෙස පිළිගනු ලබන නිර්ණායක තුළට ගැනෙන යම් විභාගයකදී, එකවර සම්මාන සාමර්ථ්‍ය දෙකක් සහ එක් සාමාන්‍ය සාමර්ථ්‍යක් ලබා තිබිය යුතුයි.

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) ප්‍රතිඵල වෙනුවට සලකා බැලෙන වෙනත් _සුදුසුකමක් මත අයදුම් කිරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් පමණක් අයදුම්පත් යොමු කිරීමට ප්‍රථම 070-6759892 අංකයෙන් විමසීමක් සිදුකරන්න.

04. ශ්‍රී ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) /ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයේදී හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඉහත විභාගවලට සමාන යැයි පිළිගනු ලබන විභාගයකදී, ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමර්ථ්‍යයක් සහ සිංහල හෝ දෙමළ භාෂාව සඳහා සම්මාන සාමර්ථ්‍යයක් තිබිය යුතුයි.

## ප්‍රවේශ විභාගය

සියලු අයදුම්කරුවන් 2023 සැප්තැම්බර් මස පැවැත්වීමට නියමිත ප්‍රවේශ විභාගය සඳහා පෙනී සිටිය යුතු වේ. නීති විද්‍යාල ප්‍රවේශ විභාගය සඳහා අන්තර්ගත වන ප්‍රශ්න පත්‍ර මෙසේය.

භාෂා හැකියාව - කාලය පැය 03

සාමාන්‍ය දැනීම සහ බුද්ධි පරීක්ෂණය - කාලය පැය 03
(මෙම ප්‍රශ්න පත්‍රය පැය 1 1/2 බැගින් වූ කොටස් දෙකකින් සමන්විත වේ)

අයදුම්කරුවන් හට සාමාන්‍ය දැනීම සහ බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිටිය හැක. අයදුම්කරු මේ සඳහා සිංහල හෝ දෙමළ මාධ්‍ය තෝරාගන්නේ නම් භාෂා හැකියාව ප්‍රශ්න පත්‍රය සඳහා ඉංග්‍රීසි මාධ්‍ය තෝරාගත යුතුය.

සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණ පත්‍රය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිටින්නේ නම්,භාෂා හැකියාව ප්‍රශ්න පත්‍රය සඳහා සිංහල හෝ දෙමළ මාධ්‍යය තෝරාගත යුතුය.

යොමු කරන ලද අයදුම්පතෙහි භාෂා මාධ්‍ය නැවත වෙනස් කිරීමක් කිසිදු හේතුවක් මත සිදුකළ නොහැක.

පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර සඳහා (http://www.sllc.ac.lk/sub_pgs/papers.html )

## විභාග ගාස්තු

(අ) සෑ.යු අයදුම්පත් එවිය යුත්තේ මාර්ගගත ක්‍රමය ඔස්සේ පමණි.

(ආ) **විභාග ගාස්තුව** රු 1200/- කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතුය.

1. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
2. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් ( Any Bank Debit Card with the Facility of Internet Transactions)
3. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon)
4. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank of Ceylon)

- ඉහත ක්‍රමය මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.
- ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවිඩයක් (SMS)මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම්

ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

**නීති විද්‍යාල ගාස්තුව** වන රු 15,000/= ක මුදල හැටන් නැෂනල් බැංකුවේ සංස්ථාගත නීති අධ්‍යාපන සභාව නමින් ඇති, ගිණුම් අංක 063020073300 (අලුත්කඩේ ශාඛාව) වෙත 2023 අගෝස්තු 16 දින හෝ ඊට ප්‍රථම **අයදුම්කරුගේ නමින්** ගෙවිය යුතුය. අදාළ රිසිට් පත entrance@sllc.ac.lk **යන ඊමේල් ලිපිනයට යොමු කිරීමෙන් පසු පමණක්** තම අයදුම්පත මාර්ගගත ක්‍රමය ඔස්සේ විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය. අදාළ රිසිට්පතෙහි අයදුම්කරුගේ මුලකුරු සහිත නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ දුරකථන අංකය අනිවාර්යයෙන් පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය. (ඉහත ගාස්තුව නිසි පරිදි ගෙවා නොතිබීම / වෙනත් අයකුගේ නමින් ගෙවීම සිදුකිරීම / අයදුම්කරුගේ නොවන තොරතුරු රිසිට්පතෙහි සඳහන් කර තිබීම වැනි කරුණු මත අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තව ද අයදුම්කරුවන් විසින් තම ලදුපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

## විභාග ප්‍රවේශ පත්‍ර

(1). අයදුම්පත් යොමු කරන අවසාන දිනෙන් පසු මාර්ගගතව යොමු කරන ලද සියලුම අයදුම්කරුවන්ගේ තොරතුරු ( Submitted Applicants Details) ඇතුළත් මෘදු පිටපතක් ශ්‍රී ලංකා නීති විද්‍යාලය වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් යොමු කරනු ලැබේ. නීති විද්‍යාලය විසින් අනුමත කරනු ලබන අයදුම්කරුවන් වෙත පමණක් විභාග ප්‍රවේශ පත්‍ර යොමු කරනු ලැබේ. විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන් තේරීමේ බලය ශ්‍රී ලංකා නීති විද්‍යාලය සතුවේ.

(2). විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලබන්නේ මාර්ගගතව පමණි. අදාළ ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ලැබේ. ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේනම් ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම් ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිට පතක් ලබා ගැනීමට හැකිය. එහිදී තමන්ගේ ෆැක්ස් අංකය සඳහන් කළ ඉල්ලීම් ලිපියක් විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන විභාග නිවේදනයේ දක්වා ඇති ෆැක්ස් අංකයට යොමුකළ යුතුය.

(3) විභාග අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ බාරගනු ලැබේ.

01 ජාතික හැඳුනුම්පත
02 වලංගු විදේශ ගමන් බලපත්‍රය
03 වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

තව ද අපේක්ෂකයින් සිය අනන්‍යතාව තහවුරු කරගත හැකි වන පරිදි මුහුණ සහ දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ නොවන අපේක්ෂකයින් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

(4) අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(5) විභාගය සඳහා පෙනී සිටීම සඳහා තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

(6) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදුවනු ඇත.

## අයදුම්පත් ප්‍රතික්ෂේප වීම

පහත කරුණු මත ඔබගේ අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැක. එමනිසා අයදුම්පත එවීමට ප්‍රථම මේ පිළිබඳ අවධානය හොඳින් යොමු කරන්න.

01. අසම්පූර්ණ නිරවද්‍ය නොවන අයදුම්පත්
02. එක් අයදුම්කරුවකු එක් අයදුම්පතකට වැඩි ගණනක් ඉදිරිපත් කර තිබීම
03. නිවැරදිව මුදල් බැරකරන ලද ලදුපත විද්‍යුත් තැපෑලෙන් නීති විද්‍යාලය වෙත යොමු කර නොතිබීම.
04. නීති විද්‍යාලය විසින් ඉල්ලා සිටින අවස්ථාවකදී අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම
05. අයදුම්පත් යොමු කරන අවස්ථාවේදී අධ්‍යාපන සුදුසුකම්/අනෙකුත් සුදුසුකම් සපුරා නොතිබීම

## සටහන

- විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ. එලෙසම ඔබ විසින් ගෙවා ඇති නීති විද්‍යාල ගාස්තුව ද ආපසු ඉල්ලුම් කළ නොහැකි වේ.

- <u>ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්</u> ; මාර්ගගත අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතුය. එසේම මාර්ගගතව අයදුම්පත යොමු කිරීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙනු ලබන උපදෙස් , කොන්දේසි නීති රීතිවලට අයදුම්කරු විසින් එකඟ විය යුතුය. එසේ අවනත නොවී ඇති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

**අයදුම් කිරීමේ ක්‍රමය**

2023 ජුලි 16 පෙ.ව 9.00 සිට 2023 අගෝස්තු 16 දක්වා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැක. එහිදී " Our services යටතේ ඇති " Online Applications – Recruitment Exams" ඔස්සේ පලකර ඇති අයදුම්පත් මාර්ගගත ක්‍රමයට (Online) ඉදිරිපත් කල යුතුය.

විදුහල්පති,
ශ්‍රී ලංකා නීති විද්‍යාලය , අලුත්කඩේ වීදිය,
කොළඹ 12.